# කොවිඩ් 19 සති පාසල

## සබරගමුව

## ගණිතය පළමු වාරය 9 ශ්‍රේණිය අප්‍රේල් 2 සතිය

1.Tn=6n-1 හි මුල් පද 3 ලියන්න.

2.15,19,23,27….. සාධාරණ පදය සොයන්න.

3. ඒකාන්තර කෝණ ,අනුරූප කෝණ,මිත්‍ර කෝණ ,ප්‍රතිමුක කෝණ පැහැදිලි රූප සටහන් 4 ක වෙන වෙනම ඇඳ හඳුන්වන්න.

4. පහත සඳහන් ප්‍රකාශ හරි නම් (√) ලකුණද වැරදි නම් (×)ලකුණද යොදන්න.

a) ද්විමය සංඛ්‍ය ලිවීමෙදි 0,1,2 යන ඉලක්කම් තුන භාවිතා කරයි. (   )

b) ඕනෑම සංඛ්‍යාවක 0 වන බලය 1 කි. (   )

5. රු 15000ක් වටිනා දුරකථනයක් 20% අලාභයක් සහිතව විකිණීමට සිදුවූයේ නම් විකුණුම් මිල සොයන්න.

6. 5% ක කොමිස් ප්‍රතිශතයක් අය කරන සමාගමකින් රු 1 500 000 ක් වටිනා ඉඩමක් විකුණාදීම සඳහා අය කරන කොමිස් මුදල කොපමණද?

7. $\frac{1}{3}+2\frac{1}{2}$

8. $3\frac{5}{6}$ න් $\frac{3}{11}$

9. මුදලකින් $\frac{1}{5}$ක් රු 300 නම් මුළු මුදල කීයද?

10. $3\frac{3}{4} \div \left(2\frac{1}{2}+3\frac{1}{4}\right)$ සුළු කරන්න.

11. 11 දෙක +111 දෙක + 1111 දෙක හි අගය සොයා එය ගණක රාමුවකින් දක්වන්න.


12.(x-8)(3-x) ද්විපද ප්‍රකාශන 2 හි ගුණිත ප්‍රසාරණය කර සුළු කරන්න.

13. ax+ay+3x+3y සාධක සොයන්න.

14. සෘජුකෝණාස්‍රයක දිග එහි පලලෙහි දෙගුණයට වඩා ඒකක 3 කින් වැඩිය. සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ගොඩ නගන්න.( සෘජුකෝණාස්‍රයේ පළල x ලෙස ගන්න)

15. x=3,y=-2 නම් x+y හි අගය සොයන්න

16. පහත රූප සටහනෙ X,Y,Z ලෙස දක්වා ඇති කෝණ වල විශාලත්වයන් සොයන්න.




17. ඝන සෙන්ටිමීටරය හා මිලි ලීටරය අතර සම්බන්ධතාව කුමක්ද?

18.පතුලෙ දිග 4m ක් හා පළල 1m වූ ඝනකාභ හැඩති ටැංකියකට ජලය ලීටර් 8000(l)ක් පුරවා ඇත.ටැංකියේ කොතෙක් උසට ජලය පුරවා ඇතිද?

19. පුද්ගලයෙකු භාණ්ඩයක් 15% ක් ලාභ ලැබෙන සේ විකුණයි.එය 20%ක් ලාභ ලැබෙන සේ විකුණුවේ නම් තව රු 200 ක මුදලක් වැඩිපුර ලැබිය හැකිව තිබුණි.භාණ්ඩය ගත් මිල හා විකුණුම් මිල සොයන්න.

20. වෙළෙන්දෙක් භාණ්ඩයක් රු 4 700කට විකිණීමෙන් 6% ක අලාභයක් අත්විය.ඔහු එය ගත් මිල සොයන්න.


සැකසුම:ගීතා පෙරේරා

ර/නිවි/කලල් ඇල්ල මහ විද්‍යාලය